# ‘මාර්තු 12’ ව්‍යාපාරය ගැන ජනතාව දැනුම්වත් කරනවා

## පැෆරල් ප්‍රමුඛ සිවිල් සංවිධාන

කල්‍යාණි - රත්නායක

නීතියේ ආධිපත්‍යය බිඳවැටීම, දේශපාලන පක්ෂ වගකීම් පැහැර හැරීම, මහජන නියෝජිතයන් සිය වගකීම් ඉටුනොකිරීම හා ජනතා කේන්ද්‍රීය මහජන සභා තුළ විවාද සාකච්ඡා හා විශ්ලේෂණ ක්‍රමයන් අභාවයට යෑම හේතුවෙන් බිඳවැටීමකට ලක්ව ඇති දේශපාලන සංස්කෘතිය නගාසිටුවීමේ අරමුණින් පැෆරල් සංවිධානය ප්‍රමුඛ සිවිල් සංවිධාන මඟින් මෙහෙයවන ‘මාර්තු 12 ව්‍යාපාරය’ වඩාත් සාර්ථක කරගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව මේ සඳහා දිවයින පුරා අත්සන් දස ලක්ෂයක් ලබා ගැනීමට නියමිත අතර මෙම ජාතික කර්තව්‍ය සඳහා දේශපාලනය පිළිබඳ සවිඥානික සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සිවිල් සංවිධානවලට, ව්‍යාපාරිකයන්ට, ආගමික සංවිධාන ඇතුළු සමස්ත පුරවැසියන්ට සහභාගි වන ලෙස ‘මාර්තු 12 ව්‍යාපාරය’ මෙහෙයුම්කරුවෝ ඉල්ලා සිටිති.